**ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමෙන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධතා හෙළිදරව්කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කළ යුතුයි. එසේ වුවද, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව රු.6,917,629 ක් වන ශේෂයට අක්මුදල් ගැලැපීම් ගිණුමක් නිවැරදිව සකස් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නිවැරදිව අක් මුදල් ගිණුමක් සකස් කර ඉදිරිපත් කළ යුතු වීම. | චක්‍රලේඛයේ ඡේද අංක 3 (1) අනුව මූල්‍ය කාර්යයසාධන වාර්තාවේ අවසාන ශේෂය සඳහා අක්මුදල් ගැලපීමේ ගිණුමක් පිළියල කළ අතර මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් වාර්තාවක් නොවන බැවින් ඒ සමග ඉදිරිපත් නොකළ බව දන්වා ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ වැය ලෙජරයේ වැය විෂයයන් 03 ක සඳහන් ප්‍රතිපාදන ඉතිරිවීම් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඒඩීඒ-2 (ii) ආකෘතියෙහි වියදම් ප්‍රකාශයෙහි සඳහන් ඉතිරිවීම් අතර රු.1,309,072 ක වෙනසක් විය. | නිවැරදි අගයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | පසුව නිවැරදි කර ගැනීමට කටයුතු කළ බව |
| (ආ) | දෙපාර්තමේන්තුවේ වැය ලෙජර අනුව වැය විෂයයන් 05 ක ප්‍රතිපාදන ඉතිරිවීම් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඒඩීඒ-2(ii) ආකෘතියෙහි වියදම් ප්‍රකාශනයෙහි සඳහන් ඉතිරිවීම් අතර රු.1,535,637 ක වෙනසක් විය. | නිවැරදි අගයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | පසුව නිවැරදි කර ගැනීමට කටයුතු කළ බව |

**1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි අවසන් ශේෂය රු.2,173,615,162 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි ආරම්භක ශේෂය රු.2,374,193,910 ක් වූ අතර එම ශේෂ අතර රු.200,578,748 ක වෙනසක් විය. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනට සහ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ ආරම්භක ශේෂය සහ අවසන් ශේෂ අතර වෙනසක් පැවති බව |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇප ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගත යුතු වීම. | පිළිතුරු සපයා නැත. |

## 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | නිරීක්ෂණය<br>වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මුදල් රෙගුලාසි 104(4) | 1,484,684 | 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරාසයට අයත් වාහන හා හානිවීම් සිද්ධි 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පරීක්ෂණ මණ්ඩල වෙත නැවත සිහිකැඳවීම් යොමු කර කඩිනමින් පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2008 අගෝස්තු 27 දිනැති අංක 2008/01 දරන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | 8,536,078 | සතුන් මිය යාම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සතුන් මියයාම් සම්බන්ධයෙන් හානි හා පාඩු ලෙස පොත්වලින් කපා හැර තිබුණි. | නිකුත් කර ඇති චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වීම. | අදාළ අංශ ඉදිරියේදී නැවතත් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව |

**2. මූල්‍ය සමාලෝචනය**
-----------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 4 අනුව කටයුතු නොකිරීම මත රු.1,298,000,000 ක් වන අයවැය ප්‍රතිපාදනවලට අමතරව රු.176,766,000 ක පරිපූරක ප්‍රතිපාදන සහ රු.84,973,991 ක දෙපාර්තමේන්තු ආදායම් උපයෝගී කරගෙන වර්ෂය තුළ වියදම් හසුරුවා තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සියලුම බැරකම් පියවීමට 2019 ප්‍රතිපාදන මත සිදු කර ඇති බවත් ආදායම් මඟින් ලැබෙන මුදල් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා යොදවා ගෙන ඇති බව |

**2.2 වියදම් කළමනාකරණය**
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 07 කට අදාළ රු.109,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් රු.65,612,613 ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණු අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක පැවතුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. | වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිවීම්වලට හේතු ඉදිරිපත් කර ඇති බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 05/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 (iv) පරිදි වෙන් කරන ලද මූලධන වියදම්වලින් සියයට 15 ක් ඉතිරිකළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 6 ක් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් රු.61,955,110 ක්, හෙවත් සියයට 0.84 ක සිට 9.78 ක දක්වා ප්‍රමාණයක් පමණක් ඉතිරි කර තිබුණි. | -එම- | 2018 වර්ෂයේ පැවති බැරකම් නිරවුල් කිරිමට සිදු වූ බැවින් ප්‍රතිපාදනවලින් වැඩි කොටසක් ඒ සඳහා වැය කිරිමට සිදු වූ බව දන්වා ඇත. |
| (ඇ) | 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 (iv) ඡේදය ප්‍රකාරව ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂය යටතේ වන වියදම් හැකිතාක් දුරට අවම කරගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද ඒ අනුව කටයුතු නොකර වාර්ෂික ප්‍රතිපාදනය වන රු.3,500,000 ට අමතරව සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.1,000,000 ක් හා මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් රු.500,000 ක් මාරු කර එකතුව රු.5,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.4,617,087 ක් වියදම් කර තිබුණි. | -එම- | 2018 වසර අවසානයට ගෙවීමට තිබූ බිල්පත්වලින් කොටසක් 2019 වසරේ ගෙවා දැමීමට සිදු වූ නිසා අමතර ප්‍රතිපාදන සලසා ගැනිමට සිදු වූ බව |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 නොවැම්බර් 30 දිනැති අංක 05/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයෙහි 4(vii) ඡේදය අනුව හා 2003 සැප්තැම්බර් 06 දිනැති අයවැය චක්‍රලේඛ අංක 162 හි සඳහන් පරිදි 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල් ලෙස රු.194,534,780 ක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් ලෙස රු.15,120,242 ක් දක්වා තිබීම හේතුවෙන් රු.179,414,538 ක වෙනසක් පැවතුණි. | සමස්ත බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට තිබූ සමස්ත බැරකම්වල වටිනාකම රු.194,534,780 වන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94(2) හි විධිවිධානවලින් බැහැරව දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 04 කට අදාළව රු.1,485,258 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳීම් ඇති කරගෙන තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අයවැය දෙපාර්තමේන්තුවේ වාචික උපදේශය වුයේ එම වැඩසටහන තුළ පවතින වෙනත් ව්‍යාපෘතියක ප්‍රතිපාදන ඉතිරි වීම් ඒ සඳහා හේතු වී ඇති බව |
| (ඇ) | ඉංජිනේරු අංශයට ලැබී තිබුණු නමුත් සහතික නොකළ එකතුව රු.3,669,130 ක් වූ බිල්පත් වටිනාකම බැඳීම් ලෙස දක්වා නොතිබුණි. | සියලු බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. | එම වටිනාකම බැරකම් ලේඛනයට ඇතුළත් නොකළ බව දන්වා ඇත. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.30,271,855 ක් වුවද එස්ඒ-52 භාණ්ඩාගාර වගුව අනුව රු.31,253,172 ක් විය. ඒ අනුව රු.981,317 ක වෙනස සඳහා හේතු හඳුනාගෙන නොතිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ගැලැපීම් කළ යුතු වීම. | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වටිනාකම රු.422,256,575 ක් වන බවත් එම වටිනාකම භාණ්ඩාගාර ගිණුම් අනුව හා සැසඳෙන බව |
| (ආ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සිට භාණ්ඩාගාරයේ හා දෙපාර්තමේන්තු ගිණුම් අතර පැවත එන රු.100,125 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදිව ගැලැපීම් සිදු කළ යුතු වීම. | භාණ්ඩාගාරය වෙත ජර්නල් පත්‍රයක් යොමුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව |
| (ඇ) | අත්තිකාරම් මුදල නිශ්චිත කාර්යයක් සඳහා යොදවා ගත යුතු වුවද, අවස්ථා 05 කදී ලබාගත් රු.122,250 ක සම්පූර්ණ අත්තිකාරම් මුදල උපයෝජනය නොකර දින 08 ත් දින 21 ත් අතර කාලයක් අත රදවා ගෙන නැවත පියවා තිබුණි. | නිශ්චිත /නිවැරදි ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා ඇත. |
| (ඇ) | නිශ්චිත ඇස්තමේන්තුවක් සකස් කර අත්තිකාරම් මුදල් ලබා නොගැනීම හේතුවෙන් අවස්ථා 29 කදී ලබාදුන් එකතුව රු.916,038 ක අත්තිකාරම් මුදලින් වැය නොවූ රු.250,211 ක ඉතිරි මුදල් ආපසු පියවා තිබුණි. | -එම- | අදාළ අංශයන්හි අධ්‍යක්ෂකවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මුදල් රෙගුලාසි 371(ඇ) ප්‍රකාරව දෙන ලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවද අවස්ථා 11 කදී ලබාදුන් අත්තිකාරම් අදාළ කාර්යය නිමකර දින 05 සිට දින 27 දක්වා කාල පරාසයන් අත රඳවාගෙන පසුව පියවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිගන්නා බව ඇත. |

**2.5 තැන්පත් ශේෂයන්**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 02 ඡේදය ප්‍රකාරව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) වගන්තිය ප්‍රකාරව නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් නොකරන සියලු ලැබීම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුයි. එසේ වුවද AFFACI ව්‍යාපෘතියට අදාළව 2016 වර්ෂයේ සිට රු.3,698,111 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන එම ගිණුමෙන් රු.1,812,666 ක් ගෙවීම් කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.1,885,445 ක් විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. | විදේශාධාර වන අතර භාණ්ඩාගාරය හරහා ලැබී නොමැති බැවින් පොදු තැන්පත් ගිණුමට තැන්පත් කර වියදම් කර ඇති බව |
| (ආ) | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,147,798 ක් වටිනා තැන්පතු 94 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රු.155,010 ක් වටිනා තැන්පතු ගෙවීම් කර ඇති බව |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සැලැසුම් කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ ඌනතාවයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා අයවැයගත ප්‍රතිපාදන රු.724,000,000 ක් හා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.164,000,000 ක් මත ක්‍රියාකාරී සැලැස්ම රු.888,000,000 කට පිළියෙල කළ යුතුයි. එසේ වුවද අවසන් වරට සංශෝධිත ක්‍රියාකාරී | මුළු මූලධන වියදම් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතු වීම. | පිළිතුරු සපයා නැත. |

සැලැස්ම රු.824,000,000 කට පිළියෙල කර තිබීම හේතුවෙන් රු.64,000,000 ක ප්‍රතිපාදන සඳහා ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර පිළියෙල කර නොතිබුණි.

## 3.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන්ගේ නිෂ්පාදන ධාරිතාව වර්ධනය කිරිමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාකාරි සැලැස්මෙහි කාර්යයන් දක්වා තිබුණු අතර එම කාර්යයන් වර්ෂය තුළ ඉටු කිරීමට කටයුතු නොකර අත්හැර දමා තිබුණි. | සැලැසුම් කළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | ඉකුත් වර්ෂයේ නිමකළ යුතු රු.6,608,440 ක් වටිනා කොන්ත්‍රාත් 02 ක් සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සියයට 65 ක මට්ටමේ පැවතුණ ද 2020 ජූලි මස 23 වැනි දින වන විටත් එම කොන්ත්‍රාත්තුව නිම නොකර අතහැර දමා තිබුණි. | සැලැසුම් කළ කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නැත. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සත්ත්ව විෂානු රසායනාගාරයට අවශ්‍ය ප්‍රතිපාදන යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය ලබාදීම මත කුර හා මුඛ රෝග එන්නත් වඩි 400000 ක් නිපදවීමේ ධාරිතාවයක් පවතින නමුත් අවශ්‍ය පහසුකම් හා ප්‍රතිපාදන නොලැබීම මත පසුගිය වාර්ෂිකව එන්නත් වඩි 400000 ක් නිෂ්පාදනය කිරීමට කටයුතු නොකර වර්ෂ 04 ක කාලය තුළ එන්නත් වඩි 113160 සිට 248730 දක්වා පරාසයක ප්‍රමාණයක් නිෂ්පාදන කර තිබුණි. | ආයතනය සතු උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | වාර්ෂික උපරිම ධාරිතාවය සඳහා ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ලබාගැනීමට ප්‍රතිපාදන ලැබී නොමැති බව |

| | | |
|---|---|---|
| (ආ) ආනයනය කරනු ලබන සත්ත්ව එන්නත් සඳහා ආදේශකයක් ලෙස උසස් තත්ත්වයේ සත්ත්ව එන්නත් දේශීයව නිපදවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.26,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවට මුළු ප්‍රතිපාදනයෙන් රු.26,137,417 ක් හෙවත් සියයට 99 ක් පෙර වර්ෂයේ වියදම් පියවීම සඳහා වැය කර තිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ඇ) කුර හා මුඛ රෝග එන්නත් සාර දේශීයව එන්නත් වඩි 113160 ක් නිෂ්පාදනය කිරීම සඳහා රු.13,500,000 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.11,266,161 ක වියදම් දරා තිබුණද දේශීයව නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කර ගනිමින් ආනයනය සීමා කිරීම වෙනුවට වාර්ෂික එන්නත් අවශ්‍යතාවයෙන් 900000 කින් සියයට 86 ක් ආනයනය කර ඒ වෙනුවෙන් රු.30,361,500 ක් වැය කර තිබුණි. | පිරිවැය අවම වන පරිදි අපේක්ෂිත නිමවුම් මට්ටම කරා ළඟා විය යුතු වීම. | පිළිතුරු සපයා නැත. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කුර හා මුඛ රෝග එන්නත් නිෂ්පාදන සඳහා 2011 මාර්තු මස රු. 38,400,320 ක් වැය කර මිලට ගන්නා ලද ජෛව ප්‍රතිකාරක උපකරණ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.4,331,120 ක් වැය කර අමතර කොටස් මිලට ගෙන තිබුණි. විගණිත දිනය දක්වාම එම අළුත්වැඩියා කටයුතු සිදු කර නොතිබීම හේතුවෙන් එන්නත් නිෂ්පාදන සිදු කිරීමට උපකරණයෙන් උපරිම ධාරිතාවයෙන් භාවිතයට ගෙන නොතිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවශ්‍යතාවයෙන් සියයට 86 ක් ආනයනය කිරීමට රු.30,361,500 ක් වැය කර තිබුණි. | අළුත්වැඩියා කටයුතු සිදුකර උපකරණයක් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත |
| (ආ) ආහාර සුරක්ෂිතතාවය හා ආහාර සඳහා පහසුකම් සැලසීම පිණිස සත්ත්වයින්ගෙන් ලබාගන්නා ආහාරවල සුරක්ෂිතතාවය සහතික කිරීමේ ව්‍යාපෘතිය රු.70,000,000 ක ප්‍රතිපාදන යටතේ ඉකුත් වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් ලද එම ප්‍රතිපාදනයෙන් ඉකුත් වර්ෂය අවසානයට රු.69,242,057 ක් හෙවත් සියයට 99 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. සත්ත්ව පෝෂණ | ව්‍යාපෘතිය අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |

රසායනාගාරය පුළුල් කිරීමේ කටයුතු සම්බන්ධ ශක්‍යතා කටයුතුවල සිදුවූ ප්‍රමාදයන් ඉතිරිවීම් සඳහා හේතු වූ බව දක්වා තිබුණද සමාලොචිත වර්ෂය තුළ එවැනි කටයුත්තක් සිදු කර නොතිබුණි. එමෙන්ම සමාලොචිත වර්ෂයේදී ද රු.50,000,000 ක ප්‍රතිපාදනයක් ලබාගෙන එම ප්‍රතිපාදනයෙන් රු.39,000,000 ක මුදලක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමෙන් පසුව රු.11,000,000 ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,200,777 ක මුදලක් හෙවත් සියයට 29 ක් ව්‍යාපෘතියේ අරමුණු කරා ළඟාවීම වෙනුවෙන් වැය නොකර ආරක්ෂක සේවා, ජලය, විදුලිය හා වෙනත් වියදම් සඳහා දරා තිබුණි.

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 සැප්තැම්බර් මාසයේදී ගරාජයක් ඉදිකිරීම වෙනුවෙන් වැට් රහිත රු.1,742,788 ක මුදලකට 2018 දෙසැම්බර් මාසයේදී නිම කිරීම එකඟ වී ගිවිසුම අත්සන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.762,059 ක වියදමක් දරා තිබුණු අතර ඉදි කිරීම අවසන් කර නොතිබූ අතර රු.2,888,000 ක ප්‍රතිපාදිත මුදලින් රු.2,125,941 ක් ප්‍රතිපාදන ඌණ උපයෝජිතව පැවතුණි. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුවීම. | වැඩ අවසන් කර නොමැති බව දන්වා ඇත. |

## 3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය පරිදි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ඇතුළත් කරමින් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළයුතු වීම. | පිළිතුරු සපයා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.4(ඇ)(iii) මාර්ගෝපදේශයෙන් බැහැර වී රු.1,742,788 ක් වටිනා ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 05 දෙනෙකු ලංසු ඇගැයීමේ කමිටුවට පත්කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු වීම. | ලංසු ඇගැයීමේ කටයුතු කඩිනමින් ඉටුකර ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රමාදවීම් වැළැක්වීම සඳහා කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය අනුව ක්‍රියා නොකිරීම හේතුව මත 2019 මාර්තු මාසය දක්වාම ආයතනයේ පවිත්‍රතා සේවය වෙනුවෙන් ඊට පෙර තෝරා ගත් ආයතනය වෙත රු.1,104,694 ක් ගිවිසුමකින් තොරව ගෙවීම් කර තිබුණු අතර රු.574,560 ක ව්‍යාජ කාර්යසාධන සහතිකයක් ලබාගෙන පවිත්‍රතා සේවය වෙනුවෙන් තෝරා ගත් ලංසුකරුවකු වෙත 2019 අප්‍රේල් මස සිට අගෝස්තු මස දක්වා රු.1,534,305 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාව අනුව 2019 වර්ෂයේ සැප්තැම්බර් මස සිට නැවත වෙළපළ මිල සැදහුම් ක්‍රමය යටතේ පවිත්‍රතා සේවය සඳහා රු.917,205 ක් අංශ තුනක් වෙනුවෙන් ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු වීම. | තාක්ෂණික ඇගැයීම් කමිටුවේ ප්‍රමාදයක් සිදුවී ඇති බව පිළිගෙන ඇති අතර ගිවිසුමක් අත්සන් කර නොමැති බව දන්වා ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.10 මාර්ගෝපදේශය පරිදි ලංසු සූක්ෂම අන්දමින් ඇගැයීමට භාජනය කර අවම මිලක් සහිත ලංසුව තීරණය කළ යුතුයි. එසේ වුවද මිල ගණන් කැඳවූ අවස්ථා දෙකේදීම එකම පිරිවිතරයක් ඉදිරිපත් කර තිබුණු ආයතනය පළමු අවස්ථාවේදී ප්‍රතික්ෂේප කර දෙවන අවස්ථාවේදී පිළිගෙන තිබුණි. එබැවින් පළමු අවස්ථාවේදී රු.32,706,900 ක මුදලකට මිලට ගත හැකිව තිබූ උපකරණය වෙනුවෙන් දෙවන අවස්ථාවේදී රු.33,700,000 ක මුදලක් ගෙවීමට සිදු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු.993,094 ක පාඩුවක් සිදුවී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු වීම. | අවස්ථා 02 කදී ටෙන්ඩර් කැඳවූ අතර අවස්ථා දෙකේදීම අවම මිල එකම ලංසුකරු විසින් ඉදිරිපත් වීම හා මිල උච්චාවචනයන් මත පිරිවැය වෙනස් වී ඇති බව දන්වා ඇත. |

## 3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### i. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කටුනායක සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානයට 2008 නොවැම්බර් මාසයේ ලබාදී ඇති රු.2,461,290 ක් වටිනා ඉන්සිනේටරය (අපද්‍රව්‍ය හෂ්මකය) 2019 මාර්තු මස සිට ක්‍රියාවිරහිතව පවතින බැවින් 2020 ජනවාරි මස වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු වීම. | අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අමතර කොටස් වෙනුවෙන් ඇස්තමේන්තුවක් ලබාදී ඇති බව දන්වා ඇත. |
| (ආ) | තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා රු.3,161,310 ක වියදමක් දරා රජයේ නිවසක් ඉදිකර තිබුණද එම නිවාසය 2014 මැයි සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | අඩුපාඩුව පිළිගන්නා බව දන්වා ඇත. |
| (ඇ) | සත්ත්ව විෂාණු රසායනාගාරයට අයත් පශු උපකරණ 7 ක් හා වාහනයක් වර්ෂ 09 සිට වර්ෂ 19 දක්වා කාල පරාසයක් නිෂ්කාර්යව පැවතුණි. එන්නත්සාර රසායනාගාරය තුළ භාවිතයට නොගන්නා යන්ත්‍ර උපකරණ 07 ක් හා ලීටර් 2000 ටැංකි 02 ක් ඉකුත් වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවතුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | අපහරණය කිරීමට, අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. |
| (ඈ) | කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථනය සතු නයිට්‍රජන් බහාලුම් 80 ක් 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විවිධ ආයතනවලට ණය පදනම මත ලබාදී තිබුණ අතර එම යන්ත්‍ර වසර 23 ක කාලයක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලීන ණය පදනමට භාණ්ඩ නිකුත් කිරීම කළ යුතු වීම. | ජාතික පශු සම්පත් මණ්ඩලය වෙත ණය පදනම මත ලබාදී ඇති අතර සය මාසිකව ණය පදනම අළුත්කරන බව දන්වා ඇත. |
| (ඉ) | කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථනයේ රසායනාගාර ගබඩාවේ පැවති රසායනික ද්‍රව්‍ය හා ඖෂධ වර්ග 30 ක කල් ඉකුත් වූ දිනය පසුවී තිබුණ අතර එම ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර උපකරණ 06 ක් 2018 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | කල් ඉකුත් වූ ද්‍රව්‍ය සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කළ යුතු වීම. | කල් ඉකුත්වූ ඖෂධ වර්ෂ 30 වෙනුවෙන් පිළිතුරු ලබාදී නොමැති අතර උපකරණ පමණක් අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2018 දෙසැම්බර් මාසයේ නිමකර භාරදෙන ලද කුණ්ඩසාලේ පශු විමර්ශන මධ්‍යස්ථානයේ කාර්යාල ගොඩනැගිල්ල හා වර්ග අඩි 1500 වන රජයේ නිවස 2020 පෙබරවාරි 14 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද කුණ්ඩසාලේ පශු විමර්ශන මධ්‍යස්ථානයේ සංචාරක නිවාසයේ වත්කම් වර්ග 09 ක් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | පශු විමර්ශන මධ්‍යස්ථානයේ මේ වන විට භාවිතයට ගන්නා වූ සංචාරක නිවාස 2020 ජනවාරි මාසයේදී පශු විමර්ශන නිලධාරීන් දෙදෙනෙකුට ලබාදී ඇති බව දන්වා ඇත. |
| (උ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම්ට අයත් සත්ත්ව විෂාණු රසායනාගාරය භාවිතයට ගන්නා අක්කර 01 රූඩ් 01 භූමි ප්‍රමාණය විගණිත දිනය වන විටත් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. |

**ii.** වාහන උපයෝජනය

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවද වාහන 08 ක් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව දන්වා ඇත. |

## 3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යය මණ්ඩලය 766 ක් වූ අතර එම කාර්යය මණ්ඩලයෙන් මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ ලැයිස්තුව ප්‍රතිශෝධනය කර අදාළ අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2012 ජනවාරි 06 දිනැති අංක එම්එල්ආර්ඩීඩී/04/01/49 දරන ලිපියට අනුව ඇප තැබිය යුතු තනතුරුවලට නිර්දේශිත ඇප මුදල දක්වා ඇති නමුත් නිලධාරීන් 315 දෙනෙකුගෙන් රු.1,759,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |

**3.9** **පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ---------------- | --------------------------- |
| (අ) | සතුන් 12 දෙනෙකු ආනයනය කිරීමෙන් පසුව මිය ගොස් තිබුණු අතර ආනයනය කරන ලද සතුන් සම්බන්ධයෙන් රක්ෂණ කටයුතු සිදු නොකිරීම මත රු.4,863,772 ක් වූ අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | සුදුසු රක්ෂණ ආයතනයක් මඟින් රක්ෂණය කර පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | රක්ෂණ වැය ප්‍රතිලාභ සමඟ ආර්ථික වශයෙන් ඵලදායි නොවන නිසා රක්ෂණය සිදු කර නොමැති බව දන්වා ඇත. |
| (ආ) | දෙපාර්තමේන්තු නිලධාරීන් 11 දෙනෙකු විදේශීය අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇප බැඳුම්කරයකට එළඹ තිබුණත් අනිවාර්යය සේවා කාලය සම්පූර්ණ නොකිරීම මත අයකර ගත යුතු රු.31,431,060 ක ඇප බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | පිළිතුරු සපයා නැත. |

**3.10** **කළමනාකරණ දුර්වලතා**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | ------------------ | --------------------- |
| පශු විමර්ශන මධ්‍යස්ථානයක ස්ථාපිත සත්ත්ව ආහාර විශ්ලේෂණ රසායනාගාරය තුළ ආහාර විශ්ලේෂණ කටයුතු සිදුකළ හැකි වුවද 2014 ජූලි මස සිට විශ්ලේෂණ කටයුතු නවතා දමා තිබුණි. සත්ත්ව ආහාර විශ්ලේෂණ කටයුතු වෙනුවෙන් උපයෝගී කර ගනු ලැබූ උපකරණ නිෂ්ක්‍රීයව තිබූ අතර එම විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමට සෞඛ්‍ය අංශයේ ඉහළ කළමනාකාරිත්වයේ හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවධානය යොමු කර නොතිබුණි. | රසායනාගාර නැවත ස්ථාපිත කර විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වීම. | උපකරණ අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බව දන්වා ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංදිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | දර්ශක හා අරමුණු හඳුනා ගත යුතු වීම. | පිළිතුරු සපයා නැත |

**5.** **යහපාලනය**

**පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්රලේඛයේ හඳුන්වාදී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව ආයතන විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව දන්වා ඇත. |
| (ආ) | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභි ප්‍රඥාප්ති පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගැයීම සඳහා ආයතන විසින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | -එම- | -එම- |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------------- |
| (අ) | කටුනායක සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ අනුමත නොවූ සත්ත්ව පාලන සහායක තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන 2019 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.402,368 ක් ගෙවා තිබුණි. | අතිරික්තයක් නොවන ආකාරයට සේවක කළමනාකරණය කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ආ) | සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානයේ අනුමත කාර්යය මණ්ඩලයට අතිරික්තව සිටි තනතුරු 06 ක නිලධාරීන් 08 දෙනෙකු වෙනුවෙන් 2019 වර්ෂයේදී පමණක් නිශ්චිත කාර්යයක් නොමැතිව රු.3,797,817 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | කාර්යය මණ්ඩලය නිවැරදි ලෙස කළමනාකරණය කළ යුතු වීම. | මෙම කාර්යය මණ්ඩලය සේවා අවශ්‍යතාවය මත යොදවා ඇති බැවින් ඔවුන්ට නිශ්කාර්යය වැටුපක් ගෙවා නොමැති බව දන්වා ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිලධාරිනියක් වර්ෂ 19 ක සේවා කාලයෙන් අවස්ථා 04 ක දී වර්ෂ 16 ක පමණ කාලයක් වෙනත් ස්ථානවල සේවය සඳහා මුදාහැර තිබුණු අතර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කළ කාලය පළාත් සේවාවද ඇතුළුව වර්ෂ 03 කට වඩා අඩු කාලයක් වූ අතර දෙපාර්තමේන්තුව විසින් 2015 පෙබරවාරි මස සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා රු.5,290,180 ක මුදලක් පශු වෛද්‍ය නිලධාරිනිය වෙත වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණද අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණද වැටුප් ප්‍රතිපූර්ණය කළ යුතු වීම. | වැටුප් ප්‍රතිපූර්ණය කර නොමැති බව දන්වා ඇත. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 951 ක් වූ අතර අතිරික්ත හා පුරප්පාඩු ගැලපීමෙන් පසුව සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 185 ක් පැවතියද තනතුරු දෙකකට අදාළව අතිරික්ත සේවක සංඛ්‍යාව 10 ක් විය. | නිවැරදි ලෙස සේවක කළමනාකරණය කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |
| (ඉ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සඳහන් පරිදි සේවය කරන සෑම මට්ටමකටම අයත් සේවකයින්ගේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා කාර්යසාධන ඇගැයීම් පත්‍ර භාවිතා කිරිම, කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරිම, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම වැනි කාර්යයන් සිදු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සපයා නැත. |